සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** **ක්‍රිස්තියානි ධර්මය - I** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

**සැලකිය යුතුයි :**

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

01. කිතු උපත සිදුවන සමයේ ජුදා සමාජය,
(1) සාමකාමීව පැවතුනි. (2) අඳුරෙන් වැසී පැවතුනි.
(3) නිදහස්ව පැවතුනි. (4) අධිරාජ්‍යයක්ව පැවතුනි.

02. ජේසුස් වහන්සේ නාසරෙත් ධර්මශාලාවේ දී සම්පූර්ණ කළේ, කුමන දිවැසිවරයාගේ අනාවැකිය ද?
(1) ආමෝස් දිවැසිවරයාගේ (2) මීකා දිවැසිවරයාගේ
(3) යෙසායා දිවැසිවරයාගේ (4) එසකියෙල් දිවැසිවරයාගේ

03. දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබමින් තම මහලු වයසේදීත් දරුවකු ඉල්ලා යාච්ඤා කළේ,
(1) සෙකරියස් හා එළිසබෙත් ය. (2) සිමියොන් හා අන්නා ය.
(3) ජාකොබ් හා රාකෙල් ය. (4) සෙත් හා රෙබෙකා ය.

04. ''ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ඔබට සම්භවන්නේ ය. එය ඔබට සලකුණය.'' මෙසේ පවසන ලද්දේ,
(1) ශාස්ත්‍රවන්තයින්ට ය. (2) පරිසිවරුන්ට ය. (3) හෙරොද් රජුට ය. (4) එඬේවරුන්ට ය.

05. ඉශ්‍රායෙල් ජනතාව චර්මඡේද පිළිවෙත ඉටුකරන්නේ දෙවියන් වහන්සේ විසින්ම ලබාදුන් නියෝගයක් ලෙසය. මෙය ආරම්භ වන්නේ,
(1) ආබ්‍රහම් තුමාගෙනි. (2) ජාකොබ් තුමාගෙනි.
(3) මෝසෙස් තුමාගෙනි. (4) සාවුල් රජතුමාගෙනි.

06. ''ඔබ මා සෙව්වේ මන්ද? මාපියාණන්ගේ මැදුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නෙහි ද?'' ජේසුස් වහන්සේ මෙම ප්‍රකාශය කළේ,
(1) උන්වහන්සේ පාවා දුන් අවස්ථාවේදී ය. (2) අවුරුදු 12 දී ජෙරුසලම් දේව මාලිගයේදී ය.
(3) දේවමාලිගය පවිත්‍ර කරනු ලබන අවස්ථාවේදී ය. (4) නාසරෙත් ධර්ම ශාලාවේදී ය.

07. ''අඳනා දෙකක් ඇති අය නැති අයට දෙත්වා'' ස්නාවක ජොහාන්තුමා මෙසේ ප්‍රකාශ කළේ,
(1) අයකැමියන්ට ය. (2) පොදුජනතාවට ය.
(3) ආරක්ෂක නිළධාරීන්ට ය. (4) ප්‍රභූ ජනතාවට ය.

08. ''එතුමන්ගේ පාවහන් පටි මුදන්නටවත් මම නොවටිමි.'' මෙම ප්‍රකාශයෙන් ඉස්මතු වන්නේ ස්නාවක ජොහාන් තුමාගේ,
(1) ශ්‍රේෂ්ඨත්වයයි. (2) සේවකත්වයයි. (3) ජ්‍යේෂ්ඨත්වයයි. (4) යටහත් පහත් බවයි.

09. ජුදෙව් නමස්කාරයේ කේන්ද්‍රස්ථානය ලෙස සලකනු ලැබුවේ,
(1) ධර්මශාලාවයි. (2) සිනගෝගයයි.
(3) ජෙරුසලම් දේව මාලිගාවයි. (4) උත්තම පූජකයාගේ නිවසයි.

10. ජේසුස් වහන්සේට සීමොන් පේදුරු හමු වූ මුල්ම අවස්ථාවේ දී ඔහුට දුන් අභියෝගය වන්නේ,

(1) මා සමග එක්වන්න යන්න ය.

(2) මාගේ ගෝලයකුවන්න යන්න ය.

(3) මාගේ රැළ පෝෂණය කරන්න යන්න ය.

(4) මෙතැන් පටන් ඔබ මිනිසුන් දිනනු ඇතැයි යන්න ය.

11. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම අනුව දෙවියන් වහන්සේගේ කැමැත්ත තේරුම් ගෙන ඉටුකරන්නෝ

(1) දෙවිවරුන් මෙන් වෙති.

(2) දේව පවුලේ සමීප සබඳතාවයට ඇතුළුවෙති.

(3) දේව අනුගාමිකයින් වෙති.

(4) දේව දරුවන් වෙති.

12. ජේසුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ක්‍රියා කිරීම නිසා සුවය ලැබූ කාන්තාවන් දෙදෙනා වන්නේ,

(1) මහලේරෝගී කාන්තාව සහ කුදු ස්ත්‍රියයි.

(2) පේදුරුගේ නැන්දනිය සහ යායිරස්ගේ දියණියයි.

(3) යායිරස්ගේ දියණිය සහ මහලේරෝගී කාන්තාවයි.

(4) කුදු ස්ත්‍රිය සහ පේදුරුගේ නැන්දනියයි.

13. රෝම රජය වෙත බදු අයකළ සුංගම් අයකරන්නන්ගේ අනුකම්පා විරහිත ක්‍රියාවන් නිසා ජුදෙව් ජනතාව ඔවුන් හැඳින්වූයේ,

(1) දේශද්‍රෝහීන් හා පවුකරුවන් ලෙස ය.

(2) දේශද්‍රෝහීන් හා සල්ලාලයින් ලෙස ය.

(3) පව්කරුවන් හා මංකොල්ලකරුවන් ලෙස ය.

(4) කොල්ලකරුවන් හා සල්ලාලයින් ලෙස ය.

14. ''රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදාගෙන් වැඩක් නැත.'' ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළේ,

(1) සීමොන්ගේ නිවසේදී ය.

(2) ලෙවීගේ නිවසේදී ය.

(3) සාකෙවුස්ගේ නිවසේදී ය.

(4) යායිරස්ගේ නිවසේදී ය.

15. රෝම පාලනයට එරෙහිව නැගී සිටි කණ්ඩායම් මර්ධනයට සද්දුසිවරු රෝම රජයට සහය දුන්නේ,

(1) රෝම පාලනය ඉතා යහපත් නිසා ය.

(2) ඔවුන් රෝම පාලනයට යටත් වූ නිසා ය.

(3) තම තත්වය හා බලය ආරක්ෂා කරගැනීම සඳහා ය.

(4) රෝම පාලනය දුර්වල වූ නිසා ය.

16. ජේසුස් වහන්සේ මිදිවත්ත හා ගොවීන් පිළිබඳ උපමාව වදාළේ සද්දුසිවරුන්ගේ කුමන පැනයට පිළිතුරු ලෙසද?

(1) අධිරාජ්‍යයාට බදු ගෙවීම පිළිබඳ පැනයට

(2) පුණර්ජීවනය පිළිබඳ පැනයට

(3) සබත කඩ කිරීම පිළිබඳ පැනයට

(4) අධිකාරී බලය පිළිබඳ පැනයට

17. ජේසුස් වහන්සේ රාජ තේජසින් ජෙරුසලමට පිවිසීමේදී කොටළුවකු පිට ගමන් කිරීමෙන්,

(1) කොටළුවා අගය කිරීමට ලක්කළ සේක.

(2) දේව රාජ්‍යයේ පදනම සාමය බව පිළිබිඹු කළ සේක.

(3) පරිසිවරුන්ගේ හැසිරීමට අභියෝග කළ සේක.

(4) සිය අනුගාමිකයින්ට අභියෝග කළ සේක.

18. ''මා සිහිකිරීම පිණිස මෙසේ සිදුකරන්න'' ජේසුස් වහන්සේ මෙසේ නියෝග කළේ,

(1) ජුදෙව් පාස්කු මංගල්‍යය සැමරීමටයි.

(2) කිතුනු පාස්කු මංගල්‍යය සැමරීමටයි.

(3) කිතුනු අණපනත් පිළිපැදීමටයි.

(4) අවසන් පාස්කු භෝජන පිළිවෙත පැවැත්වීමටයි.

19. ජේසුස් වහන්සේගේ ඔලීව කන්දේ යාච්ඤාවෙන් අපට උගන්වන්නේ.

(1) දේව කැමැත්තට මුල්තැන දිය යුතු බවයි.

(2) දුක් විඳීමට සූදානම් විය යුතු බවයි.

(3) පීඩාවන්ට මුහුණ දීමට සිදුවන බවයි.

(4) අන්‍යයන් වෙනුවෙන් වැය විය යුතු බවයි.

20. ජුදෙව් සමාජය යමෙක් පිළිගැනීමේදී භාවිත කළ සිඹීමේ චාරිත්‍රය ජේසුස් වහන්සේ වෙනුවෙන් භාවිත කළේ,
(1) සීමොන්ගේ ගෙදරට පිළිගැනීමේදී ය. (2) නාසරෙත් ධර්මශාලාවේ දේශනයේදී ය.
(3) ගෙත්සෙමන උයනේ පාවාදීමේදී ය. (4) ජෙරුසලම් දේවමාලිගාවේදී ය.

21. ජේසුස් වහන්සේගේ කුරුසි පූජාව තුළින් ඉවත් කළ සාමාන්‍ය ජනතාවට දෙවියන් වහන්සේ වෙත යාමට තිබූ බාධකය නම්,
(1) උත්තම පූජක තනතුරයි. (2) ජුදෙව් ව්‍යවස්ථාවයි.
(3) රෝම අධිරාජ්‍යයේ බලයයි. (4) දේව මාලිගාවේ තිරයයි.

22. ජේසුස් වහන්සේ වරෙක ක්‍රිස්තුවරයාණන් බවත් වරෙක නාඳුනන බවත් ප්‍රකාශ කළ ශ්‍රාවකයා වන්නේ,
(1) ජොහාන් ය. (2) පේදුරු ය. (3) ජාකොබ් ය. (4) මතෙව් ය.

23. පිටිසර ප්‍රදේශයකින් පැමිණ ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වූ පුද්ගලයා වන්නේ,
(1) සිරේනියේ සීමොන් ය. (2) අරිමාතියේ ජෝසෙප් ය.
(3) සිසිලියාවේ ජෝසෙප් ය. (4) සිරියාවේ නාමන් ය.

24. ''ඒකාන්තයෙන්ම සමිඳාණන් වහන්සේ නැගිට සිටින සේක.'' මෙසේ ප්‍රකාශ කරනු ලැබුවේ,
(1) එම්මාවුස් ගමන ගිය ශ්‍රාවකයින් ය. (2) සොහොන වෙත ගිය කාන්තාවක් ය.
(3) සොහොන වෙත ගිය සිමොන් පේදුරු ය. (4) උත්ථානය අත්දුටු ශ්‍රාවකයින් ය.

25. ජුදෙව් ජනතාව අතර බව්තීස්ම පිළිවෙත පැවතුනේ,
(1) ශුද්ධාත්ම අනුහසට විවෘත වීමට ය. (2) පිරිසිදු වීමේ බාහිර සංකේතයක් ලෙස ය.
(3) පාපය සෝදා හැරීම පිණිස ය. (4) දේව නියෝග පිළිපැදීමක් ලෙසට ය.

26. අපට පැමිණෙන පරීක්ෂාවන් ජයගැනීමට නම් අප කළ යුතු වන්නේ,
(1) දේව නමස්කාරයන්ට සහභාගී වීම ය.
(2) දිනපතා ශුද්ධ බයිබලය කියවීම ය.
(3) දෙවියන් වහන්සේ කෙරෙහි ස්ථිර ඇදහිල්ලෙන් සිටීම ය.
(4) දිනපතා යාච්ඤා කිරීම ය.

27. ජේසුස් වහන්සේගේ උත්ථානය හා ස්වර්ගාරෝහණයෙන් පසු ශ්‍රාවකයින්ගේ සාක්ෂි දැරීමේ පදනම වූයේ උන්වහන්සේගේ,
(1) උත්පත්තියයි. (2) බෞතීස්මයයි. (3) කැපකිරීමයි. (4) රූප විපර්යාසයයි.

28. රූප විපර්යාසයේ තේජශ්‍රීය අත්දුටු ශ්‍රාවකයින් ජේසුස් වහන්සේට යෝජනා කරනු ලැබුවේ,
(1) මණ්ඩප තුනක් සෑදීමට ය. (2) එතැනින් ඉවත්වී යාමට ය.
(3) මේ සිද්ධිය අන් අයට ප්‍රකාශ කිරීමට ය. (4) මෙම සිද්ධිය සඟවා තබා ගැනීමට ය.

29. දේව රාජ්‍යයෙහි පුරවැසිභාවය ලැබීමට නම් අප කළ යුතු වන්නේ,
(1) බයිබලය කියවීමයි. (2) යාච්ඤා කිරීමයි.
(3) ඉරුදින දේවස්ථානයට යාමයි. (4) දේව කැමැත්ත ඉටු කිරීමයි.

30. ජේසුස් වහන්සේ සිදුකළ මරණින් උත්ථාන කිරීමක් නොවන්නේ,
(1) යායිරස්ගේ දියණිය ය. (2) සිරියාවේ නාමන් ය.
(3) මාර්තාගේ සොයුරු ලාසරස් ය. (4) කානාහි වැන්දඹුවගේ පුත්‍රයා ය.

31. පාපයට වැටුණු අයකු ඉන් ඉවත් වී දෙවියන් වහන්සේ වෙතට එනතුරු උන්වහන්සේ බලා සිටින බව කියවෙන උපමා කථාව වන්නේ,
(1) වපුරන්නාගේ උපමාකථාවයි.
(2) මිදිවත්ත හා ගොවීන් පිළිබඳ උපමාකථාවයි.
(3) අකීකරු පුත්‍රයා පිළිබඳ උපමාකථාවයි.
(4) විශ්වාසී හා අවිශ්වාසී දාසයින් පිළිබඳ උපමාකථාවයි.

32. ජේසුස් වහන්සේ විසින් සේවක නායකත්වය ආදර්ශයෙන් දක්වූ අවස්ථාවක් වන්නේ,

(1) කුඩා දරුවකු අගය කිරීමයි. (2) වැන්දඹුව පඬුරු දැමීම අගය කිරීමයි.

(3) පරිසිවරුන්ගේ ක්‍රියා විවේචනය කිරීමයි. (4) සද්දුසිවරුන්ට චෝදනා කිරීමයි.

33. අන් අය වෙනුවෙන් වැයවීම දේවරාජ්‍යයේ පුරවැසියන් තුළ පැවතිය යුතු සුවිශේෂී චරිත ලක්ෂණයකි. මෙය පෙන්වා දීමට ජේසුස් වහන්සේ පැවසූ උපමා කථාව වන්නේ,

(1) වපුරන්නාගේ උපමා කථාවයි.

(2) යහපත් සමාරිතයාගේ උපමා කථාවයි.

(3) නැති වූ බැටළුවා පිළිබඳ උපමා කථාවයි.

(4) පරිසියා සහ අයකැමියාගේ උපමා කථාවයි.

34. ''හිවලුන්ට බෙන ද අහසේ පක්ෂීන්ට කැදලි ද ඇත. එහෙත් මනුෂ්‍ය පුත්‍රයාණන්ට හිස තැබීමටවත් තැනක් නැත.'' ජේසුස් වහන්සේගේ මෙම ප්‍රකාශයෙන් අදහස් වන්නේ,

(1) තම මෙහෙය ඉතා දුෂ්කර එකක් බවය.

(2) තම මෙහෙය දුගී දුප්පතුන් උදෙසා කරන එකක් බවය.

(3) තමා ඉතා දිළිඳු තැනැත්තෙකු බවය.

(4) තමා අනුගාමී වන අය දිළින්දන් විය යුතු බවය.

35. දේව රාජ්‍යයේ පුරවැසිභාවය පතන අය තුළ තිබිය යුතු වැදගත් ගුණාංගයකි නිහතමානීකම. මෙය ජේසුස් වහන්සේ සිය ජීවිත ආදර්ශයෙන් පෙන්වූ අවස්ථාවක් වන්නේ,

(1) මුල් ගෝලයින් කැඳවීමයි. (2) රූප විපර්යාසය වූ අවස්ථාවයි.

(3) ප්‍රේරිතයින් 12 දෙනා නම් කිරීමයි. (4) ශ්‍රාවකයින්ගේ පාද සේදීමයි.

36. ජේසුස් වහන්සේගේ කාලයේ ඉශ්‍රායෙල් සමාජයේ යමකු දුක් විඳින්නේ,

(1) දෙමාපියන්ගේ පව් නිසා ය. (2) පෙර ආත්මවල පව් නිසා ය.

(3) තමන්ගේ පව් නිසා ය. (4) අනුන්ගේ පව් නිසා ය.

37. 'මා සමග අපේ උරුමය බෙදාගන්නට මගේ සහෝදරයාට කිව මැනව'' මෙසේ පැවසූ තරුණයාට ජේසුස් වහන්සේ පිළිතුරු දෙනු ලැබුවේ,

(1) ධනපතියා සහ ලාසරස් පිළිබඳ උපමාවෙනි. (2) පරිසියා සහ අයකැමියා පිළිබඳ උපමාවෙනි.

(3) එල නැති අත්තික්කා ගස පිළිබඳ උපමාවෙනි. (4) පොහොසත් මෝඩයා පිළිබඳ උපමාවෙනි.

38. ශුද්ධ ලූක් තුමාට අනුව ජේසුස් වහන්සේගේ නැවත පැමිණීම සිදුවන්නේ,

(1) පෙර දැනුම් දීමක් කිරීමෙන් පසුව ය. (2) ගෙයක් බිඳීමට සොරකු එන්නාක් මෙනි.

(3) දේවදූතයන් පිරිවරා මහා පෙරහැරක් මෙනි. (4) සියලු දෙනා රැස්කර මහා උත්සවයක් ලෙසිනි.

39. අත්තිවාරම් දෙක නැමැති උපමාවෙන් අපට උගන්වන්නේ,

(1) අපගේ ජීවිතය දේව වචනය මත ගොඩනගා ගත යුතු බව ය.

(2) ගෙයක් ඉදිකිරීමේදී ශක්තිමත් අත්තාවරමක් දැමිය යුතු බව ය.

(3) අපගේ ජීවිතවලට විවිධ කුණාටු එන බව ය.

(4) ශක්තිමත් අත්තිවාරමක් නැතිවිට ගෙය ඉක්මනින් කඩා වැටෙන බව ය.

40. යාච්ඤාව කිතුණු ජීවිතයට වැදගත් වන්නේ ඒ තුළින්,

(1) දෙවියන් වහන්සේට කථා කළ හැකි නිසා ය.

(2) දෙවියන් වහන්සේට අපේ උවමනාවන් ඉදිරිපත් කළ හැකි නිසා ය.

(3) දෙවියන් වහන්සේ සහ අප අතර පෞද්ගලික සබඳතාවය ඇතිවන නිසා ය.

(4) දෙවියන් වහන්සේට ළංවිය හැකි නිසා ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

10 ශ්‍රේණිය **ක්‍රිස්තියානි ධර්මය - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයः |
|---|

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) දේව රාජ්‍යය තුළ දක්නට ලැබෙන ප්‍රධාන වටිනාකම් දෙක නම් කරන්න.

(ii) ජේසු බිළිඳා බැලීමට පෙරදිගින් පැමිණි ශාස්ත්‍රවන්තයින් රැගෙන ආ දේවල් දෙකක් නම් කරන්න.

(iii) ජුදෙව් සමාජයේ පව්කරුවන් ලෙස හඳුන්වනු ලැබූ ජන කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(iv) ස්නාවක ජොහාන්තුමාට අනුව ජේසුස් වහන්සේ ජනතාව බෞතීස්ම ස්නාපනය කරනු ලබන්නේ කෙසේ ද?

(v) පරිසිවරුන් තම ධාර්මික බව ප්‍රසිද්ධියේ පෙන්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(vi) ජුදෙව් නායකයින් විනිශ්චය සඳහා ජේසුස් වහන්සේ ගෙනයනු ලැබුවේ කවුරුන් වෙතට ද?

(vii) ''ජීවමාන නැතැත් වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද, උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ උත්ථානවූ සේක.'' මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් ද? කාහට ද?

(viii) සාතන් ජේසුස් වහන්සේට පරීක්ෂා ගෙන ඒමෙන් අපේක්ෂා කළේ කුමක් ද?

(ix). ජේසුස් වහන්සේ කන්දට නැග යාච්ඤාවේ යෙදී සිටියදී ශ්‍රාවකයින් දුටු දර්ශන දෙකක් සඳහන් කරන්න.

(x). රන්කාසි දසය පිළිබඳ උපමා කථාවට අනුව දේව රාජ්‍යයේ පුරවැසියන් තුළ තිබිය යුතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි.)

(02) (i) විශේෂ උපත් පිළිබඳව දේවදූත පණිවිඩ ලැබූ දෙදෙනා නම් කරන්න.

(ii) ඔවුන්ගේ ප්‍රතිචාර කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ඉහත ආකාරයේ අභියෝගාත්මක දේව කැඳවීමක් ඔබට ලැබුණොත් ඔබ ප්‍රතිචාර දක්වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10 යි.)

(03) (i) ජේසුස් වහන්සේ වෙනුවෙන් ඉටුකළ ජුදා චාරිත්‍ර දෙකක් නම් කරන්න.

(ii) කිතුනු සසුන තුළ සිදුකරනු ලබන ආගමික චාරිත්‍ර තුනක් සඳහන් කරන්න.

(iii) ශ්‍රී ලාංකීය සමාජය තුළ පවතින චාරිත්‍ර හතරක් නම් කර ඒවා ඉටු කිරීමේ දී කිතුනු අප ක්‍රියා කළ යුතු අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10 යි.)

(04) (i) විරුද්ධ මත දරුවත් ජේසුස් වහන්සේට විරුද්ධව ක්‍රියා කිරීමට එක් වූ ජන කණ්ඩායම් දෙක නම් කරන්න.

(ii) පරිසිවරුන් ජේසුස් වහන්සේට විරුද්ධව චෝදනා එල්ල කළ අවස්ථා තුනක් සඳහන් කරන්න.

(iii) ජේසුස් වහන්සේ පරිසි විනයධරයන්ට දුන් උපදෙස්වලින් අපගේ ජීවිතවලට ගතහැකි ආදර්ශයන් සඳහන් කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10 යි.)

(05) (i) ජේසුස් වහන්සේ විසින් සිදුකළ ප්‍රාතිහාර්යයන් වර්ග ගණන කීයද?

(ii) එම ප්‍රාතිහාර්යයන් වර්ග තුනක් සඳහන් කරන්න.

(iii) ජේසුස් වහන්සේ සිදුකළ එම ප්‍රාතිහාර්යයන් මඟින් අපට දෙන පණිවිඩය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10 යි.)

(06) (i) ජේසුස් වහන්සේ මහා මංගල භෝජනය පිළිබඳ උපමාව වදාළේ කොහේදී ද? කුමන අවස්ථාවේදී ද?

(ii) එම උපමාවට අනුව දේවරාජ්‍යයේ භෝජනයට නැවත කැඳවනු ලැබූවන් තිදෙනෙකු නම් කරන්න.

(iii) මහා මංගල භෝජනය නැමැති උපමාවෙන් දැක්වෙන දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති 05 ක් ලියා දක්වන්න.

(ලකුණු 2 + 3 + 5 = 10 යි.)

(07) පහත මාතෘකා අතුරින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) ස්නාවක ජොහාන්

(ii) සිමියොන් සහ අන්නා

(iii) දේව මාලිගාව පවිත්‍ර කිරීම

(iv) සෙන්හෙන්ඩ්‍රියන් මන්ත්‍රණ සභාව

(ලකුණු 5 × 2 = 10 යි.)

The National e-learning Portal for the General Education

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(1) | 4 -(4) | 5 -(1) | 6 -(2) | 7 -(2) | 8 -(4) | 9 -(3) | 10 -(4) |
| 11-(2) | 12 -(1) | 13 -(1) | 14 -(2) | 15 -(3) | 16 -(4) | 17 -(2) | 18 -(4) | 19 -(1) | 20 -(3) |
| 21-(4) | 22 -(2) | 23 -(1) | 24 -(1) | 25 -(2) | 26 -(3) | 27 -(4) | 28 -(1) | 29 -(4) | 30 -(2) |
| 31-(3) | 32 -(1) | 33 -(2) | 34 -(1) | 35 -(4) | 36 -(3) | 37 -(4) | 38 -(2) | 39 -(1) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) යුක්තිය හා ධර්මිෂ්ඨකම (ii) රන්, තුවරලා, ගන්ධරස / රත්තරන්, කට්ටකුමංජල්, සුවඳලාටු (iii) රෝගීන්, වැන්දඹුවන්, කාන්තාවන්, දරුවන්, අන්‍යජාතීන්, අයකැමියන් (iv) ශුද්ධාත්මයාණන්ගෙන් හා ගින්නෙන් (v) මංසන්දිවල ප්‍රසිද්ධියේ යාච්ඤා කිරීම, තම වස්ත්‍රවල ශුද්ධ ලියවිලි පාඨ ලියා ගැනීම, දන්දීමේ දී හොරණෑ නාදයෙන් එය ප්‍රචලිත කිරීම (vi) පිලාත් ආණ්ඩුකාරවරයා සහ හෙරොද් රජතුමා (vii) දේවදූතයන් විසින් මග්දලාගේ මරියා ඇතුළු කාන්තාවන්ට (viii) ලෞකික රාජ්‍යය මිහිපිට ස්ථාපිත කිරීමට ජේසුස් වහන්සේ පොළඹවා ගැනීමටය. (ix) උන්වහන්සේගේ මුහුණුවර වෙනස්වීම, වස්ත්‍ර ධවල කාන්තියකින් බැබළීම, මෝසෙස් සහ එළියා තේජශ්‍රීයෙන් වැඩ සිටීම. (x) 10 ශ්‍රේණියේ පෙළපොත 106 පිටුව (දේව රාජ්‍යයේ පුරවැසියන්)

(02) (i) සෙකරියස් පූජකතුමා, මරියතුමිය (ii) සෙකරියස් මුලින් සැක කළත් පසුව විශ්වාස කිරීම / මරියතුමිය විශ්වාසයෙන් භාරගැනීම (iii) අභියෝගය භාර ගනිමින් යහපත් ප්‍රතිචාර දක්වෙන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

(03) (i) චර්මඡේදනය, කැපකිරීම, අවුරුදු 12 දී ජෙරුසලම් දේවමාලිගයට යාම. (ii) බෞතීස්මය, කැපකිරීම, ශුද්ධ සහභාගීකම (iii) අකුරු කියවීම, නම් තැබීම, රන්කිරි කට ගෑම, මුල්ගල තැබීම, ගෙට ගෙවැදීම, බෝවන රෝග ආදිය, ශුද්ධ බයිබලයට පටහැනි නොවී දෙවියන් වහන්සේට මුල්තැන දෙමින් සිදුකරන අයුරු විස්තර කර තිබීම.

(04) (i) පරිසිවරු හා සද්දුසිවරු (ii) අංශභාග රෝගියා සුවකිරීම, ලෙවීගේ නිවසේදී, උපවාස ප්‍රශ්නය, සබත කඩකිරීමේ ප්‍රශ්නය, සමත්දින දියඋදර රෝගියා සුවකිරීම. (iii) • දේව වචනය වචනාර්ථයෙන් නොව එහි ඇති හරය අවබෝධ කරගත යුතු බව. • ලොවට පෙනෙන ලෙස බාහිර පිළිවෙත්වලින් නොව, අපගේ ඇතුලාන්තය (අධ්‍යාත්මය) නිවැරදි විය යුතු බව. • නිහතමානී යටහත් පහත් පැවැත්ම කිතුනු ජීවිත වලින් නිරන්තරයෙන් ප්‍රකාශ විය යුතු බව. • දෙවියන් වහන්සේට හා ලෞකික වස්තුවට එකවර සේවය කළ නොහැකි බව. • අප ප්‍රතික්ෂේප කළ යුත්තේ පාපය මිස පව්කරුවන් නොවන බව. • දේවරාජ්‍යයේ වටිනාකම් අපතුළ ගොඩනංවාගත යුතුබව.

(05) (i) 04 යි. (ii) සුවකිරීම්, අශුද්ධාත්ම දුරු කිරීම්, ස්වභාවධර්මය අභිබවා කළ ක්‍රියාවන්, මරණින් උත්ථාන කිරීම් (iii) • ජේසුස් වහන්සේ නිතර දයානුකම්පාවෙන් සිටීම • ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් සිටීමෙන් නපුරේ බලය පරාජය කළ හැකි බවත් දේව රාජ්‍යය තුළ නපුරට බලයක් නොමැති බව විස්තර කර තිබීම.

(06) (i) පරිසිවරයකුගේ නිවසේ භෝජන සංග්‍රහයකට සහභාගී වූ අවස්ථාවේ දී (ii) දිළින්දන්, අබ්බගාතයින්, අන්ධයින්, කොරුන් (iii) 10 ශ්‍රේණිය පෙළපොත 98 පිටුව

(07) (i) 10 ශ්‍රේණිය පෙළපොත 12 පිටුව (ii) 10 ශ්‍රේණිය පෙළපොත 18 පිටුව (iii) 10 ශ්‍රේණිය පෙළපොත 53 පිටුව (iv) 10 ශ්‍රේණිය පෙළපොත 61 පිටුව